# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2401/40 - 2024 සැප්තැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.09.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත**

30 වන වගන්තිය යටතේ දැන්වීම

මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2397/51 දරන හා 2024.08.15 දිනැතිව *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* නිකුත් කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 21 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි (ආ) ඡේදයේ සඳහන් "පස්වරු 4.00 දක්වා පවත්වනු ලබන බවත් "; යන වචන හා ඉලක්කම් ඉවත්කොට ඒ වෙනුවට "පස්වරු 4.00 වන විට ඡන්ද පොළේ පෝලිමේ/ පෝලිම්වල රැඳී සිටින සියලුම ඡන්ද දායකයන්ට ඡන්ද පත්‍රිකා භාරදෙනු ලබන වේලාව දක්වා පවත්වනු ලබන බවත්; එම ඡන්ද දායකයන් වෙත ඡන්ද පත්‍රිකාව නිකුත් කිරීම සිදු කළ යුතු බවත්" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් එම දැන්වීම සංශෝධනය කරනු බව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 30 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 13 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය.
සරණ මාවත,
රාජගිරිය.

EOG 09 - 0117

1A - G 42703 — 19 (2024/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*